# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.26 පැය 0650 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/401/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**වෙඩි තබා ත්‍රිත්ව මනුෂ්‍ය ඝාතනයේ තවත් සැකකරුවෙකු අත්අඩංගුවට - තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.02.18 වන දින මිද්දෙණිය පොලිස් වසමේදී වෙඩි තබා ත්‍රිත්ව මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධයේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මිද්දෙණිය පොලිසිය හා තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

2025.02.25 වන දින උදෑසන කාලයේ වීරකැටිය පොලිස් වසමේ වකමුල්ල ප්‍රදේශයේදී තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම අපරාධයට ආධාර අනුබලදීම හා කුමන්ත්‍රණය කිරීම සම්බන්ධව සැකපිට තවත් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මිද්දෙණිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන හකුරුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඒ අනුව මෙම අපරාධයට අදාලව මේ දක්වා සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර මිද්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**